# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் அமைச்சு
# MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01 Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11 - 2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: BD/CBP/4/1/17 - 2015
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2014.12.04


**ජාතික අයවැය චක්‍රලේඛ අංක: 04/2014**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් / පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් / දිස්ත්‍රික් ලේකම්වරුන් /
දෙපාර්තමේන්තු ප්‍රධානීන් /සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ
රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත,

**2014 වර්ෂයේ ප්‍රතිශෝධිත ඇස්තමේන්තු තුළ වියදම් දැරීම**

2013 අංක 36 දරණ විසර්ජන පනත සංශෝධනය කරමින්, 2014 මුදල් වර්ෂය සඳහා වූ ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව ඇතුළත් 2014 අංක 47 දරණ විසර්ජන (සංශෝධන) පනත පාර්ලිමේන්තුව විසින් 2014 නොවැම්බර් මස 24 වන දින සම්මත කර ඇත. එම විසර්ජන (සංශෝධන) පනත මගින් රජයේ සාමාන්‍ය පොදු සේවා සහ විශේෂ නීති සේවා කටයුතු සඳහා වන වියදම් සංශෝධනය කර ඇති අතර, අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා පමණක් 2013 අංක 36 දරණ පනතේ සීමාවන් නොවෙනස්ව පවතී. 2014 වර්ෂයේ ප්‍රතිශෝධිත ඇස්තමේන්තු තුළ ඇතුළත් ප්‍රතිපාදන වියදම් කිරීම සඳහා අදාළ අධිකාරී බලපත්‍ර ගරු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් අනුමත කර ඇත.

02. ඒ අනුව, සංශෝධිත ඇස්තමේන්තුවලට අදාළ ගෙවීම් සඳහා ඉහත අනුමැතිය ලැබූ දින සිට වවුචර්පත් හා වෙනත් ලියවිලි මත පහත සඳහන් පරිදි අදාළ අධිකාරිය සටහන් කළයුතු වේ.

(අ) සාමාන්‍ය පොදු සේවා සඳහා 2014 අංක 2 දරණ සාමාන්‍ය බලපත්‍රය
(ආ) විශේෂ නීති සේවා කටයුතු සඳහා 2014 අංක 2 දරණ විශේෂ නීති අධිකාරී බලපත්‍රය

අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා 2014 අංක 1 දරණ අත්තිකාරම් බලපත්‍රය තවදුරටත් වලංගු වේ.

03. එක් එක් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු සහ පළාත් සභා මට්ටමේ 2014 ප්‍රතිශෝධිත ඇස්තමේන්තු (2015 සඳහා වන මුද්‍රිත ඇස්තමේන්තු තුළ ඇතුළත් අනුමත ප්‍රතිපාදන) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ (www.treasury.gov.lk) ජාතික අයවැය දෙපාර්තමේන්තුව යටතේ පළ කර ඇත. 2014 වර්ෂය සඳහා රාජ්‍ය වියදම් කළමනාකරණය කරගැනීම, ගිණුම් කටයුතු සහ විසර්ජන ගිණුම් පිළියෙල කිරීමේ කටයුතු සඳහා මෙම සංශෝධිත ඇස්තමේන්තු අදාළ කරගත යුතු වේ. මෙම සංශෝධිත

ඇස්තමේන්තුව පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද 2015 මුද්‍රිත අයවැය ඇස්තමේන්තුවෙහි "2014 ප්‍රතිශෝධිත අයවැය" යන තීරය යටතේ දක්වා ඇත.

04. 2015 අයවැය යෝජනා අනුව, 2014 නොවැම්බර් මස සිට රාජ්‍ය සේවකයන්ට සහ විශ්‍රාමිකයින්ට ගෙවනු ලබන අන්තර් දීමනාව වෙනුවෙන් අතිරේකව අවශ්‍ය වන ප්‍රතිපාදන පිළිබඳ ඇගයීමක් කර ඒ ඒ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු වෙත ඉදිරියේදී ලබාදීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරනු ඇත.

05. 2014 වර්ෂය සඳහා වන වියදම් ඇස්තමේන්තු සංශෝධනය කිරීමේදී 2014 සැප්තැම්බර් 30 දක්වා අනුමත කරන ලද ප්‍රතිපාදන මාරුකිරීම් සහ පරිපූරක සහාය සේවා හා හදිසි අවශ්‍යතා වෙනුවෙන් ව්‍යාපෘතිය මගින් ලබාදෙන ලද අතිරේක ප්‍රතිපාදනවලට අදාල ගැලපීම් සියල්ල ද ඇතුලත් කර ඇති අතර, අත්‍යවශ්‍ය ඉදිරි වියදම් පිළිබඳව කරන ලද පුරෝකථනයන් ද සැලකිල්ලට ගෙන ඇත. අදාල ප්‍රතිශෝධිත ඇස්තමේන්තු මගින් එක් එක් වියදම් දරණ ආයතනවලට සලසා දී ඇති පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රතිපාදන සීමාවන් තුල රැඳී සිටිමින් මුදල් රෙගුලාසිවලට සහ අදාල අනෙකුත් නීතිරීති, රෙගුලාසි සහ පටිපාටි වලට අනුකූල වන පරිදි 2014 වර්ෂය තුල අදාල වියදම් කළමනාකරණය කර ගැනීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්, ගණන් දීමේ නිලධාරීන් සහ ප්‍රධාන ගණකාධිකාරීවරුන් කටයුතු කළයුතු වේ.

06. මෙම චක්‍රලේඛය පිළිබඳව කිසියම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වේ නම් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් (දුරකථන අංක 011 - 2484665) වෙතින් ලබා ගත හැකිය.

එස්.ආර්.ආටිගල
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්
භාණ්ඩාගාර ලේකම් වෙනුවට

පිටපත්: 1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති